# ලිංගික හිරිහැර ඇතිවිම් වැලැක්විමේ පනත

## විදේශ ශෘහස්ථ සේවකයින් සහ ඒ අයගේ සේවාදායකයින් සඳහා සැකසුනු මාර්ගෝපදේශයක්

平等機會委員會
EQUAL OPPORTUNITIES COMMISSION







(සිංහල)





## I. හැඳින්වීම

සේවා ස්ථාන වලදී සහ විශේෂයෙන් පුද්ගලික ගෘහස්ථ පරිසර තුලදී විදේශීය ගෘහස්ථ සේවකයින් ලිංගික හිරිහැර වලට ලක්වීම සුලබ ගැටළුවකි. 2014 වර්ෂයේදී සමාන අවස්ථා කොමිසම (EOC) සිදුකරන ලද සමීක්ෂණයකින් හෙළි වූයේ පසුගිය මාස 12 තුල විදේශීය ගෘහස්ථ සේවකයින්ගෙන් 6.5% න් ලිංගික හිරිහැර වලට ලක්වන බවයි. ලිංගිකව හිරිහැර කරන ප්‍රධාන අපරාධ කාරයන් වූයේ ගෘහයේ ජීවත් වන සේවාදායකයින් සහ වෙනත් පදිංචි කරුවන්ය.

සේවා ස්ථානයේදී ලිංගික හිරිහැර සිදුකිරීම නීති විරෝධී වේ. ලිංගික වෙනස්කොට සැලකීමේ පනත(SDO) විදේශීය ගෘහස්ථ සේවකයින් ඇතුළු සියළු දෙනාම ලිංගික හිරිහැරකම් වලින් සහ ලිංගිකත්වයට විරුද්ධ සේවා පරිසරයකින් ආරක්ෂා කරනු ලබයි. සේවාදායකයින්ද තම සේවා ස්ථානයේ ලිංගික හිරිහැරකම් වලින් තොරව පවත්වාගෙන යාමට බැඳී සිටි.

## සේවකයින් සඳහා:

### II. ලිංගික වෙනස්කොට සැලකීමේ පනත යටතේ ඇති ඔබේ අයිතීන් ගැන දැනුවත් වන්න

ලිංගික හිරිහැර යනුවෙන් හඳුන්වන්නේ අනවශ්‍ය ලෙස ලිංගික අවධානයට සහ හිරිහැර වලට ලක්වීමයි. නිතියට අනුව ලිංගික හිරිහැරකම් ආකාර දෙකකි:

(1) යම් අවස්ථාවලදී ලිංගිකත්වය පාදක කොටගෙන අනාරාධිතව පුද්ගලයෙකු ඔබ අමනාප වන ආකාරයට අවමන් කිරීම හෝ තැතිගැන්වීම් සිදු කිරීම.

උදාහරණ: ස්පර්ශ කිරීම, අනවශ්‍ය ලෙස ලිංගික දේ පැවසීම, ලිංගික ශබ්ද නැගීම, හෝ ලිංගික ඉරියව් දැක්වීම, වෙන කෙනෙකු ස්පර්ෂ කරන ලෙස පැවසීම, ලිංගික සබඳතා පැවැත්වීමට ආරාධනා කිරීම.

(2) කාමුක ස්වභාවය සහිත ක්‍රියාවන්, භාෂා හෝ පින්තූර සහිත ලිංගික හිංසන ආකල්පයකින් ක්‍රියා කරන සේවා පරිසරයක්. එනම්.

උදාහරණ: නිවැසියකු නිවස තුළදී හෝ සේවය කරමින් සිටියදී අසභ්‍ය චිත්‍රපට නැරඹීම හෝ ඔබ ඉදිරියේ නිරුවත් වීම තුළින් ඔබව බියට පත් කිරීම.

ගෘහ සේවකයින් සඳහා සේවා ස්ථානයේ ලිංගික හිරිහැරකම් වලට එරෙහිව ආරක්ෂාව සඳහා පහත කරුණු අදාලවේ:



- ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශ්වයටම විරුද්ධ ලිංගිකයින්ගෙන් සහ එකම ලිංගිකයින්ගෙන් සිදුවන හිංසනයන් ඇතුළු;
- එක පරිශ්‍රයක ජීවත්වන සියළුම පුද්ගලයින්ගෙන් සිදුවන හිංසනයන්;
- නොසිතා සිදු කරන හිංසනයන් එක්වරක් පමණක් සිදුවිම හෝ එය කිසිවකු නොදැක සිදුවීම.
- අතීතයේදී ඔබ අකමැත්තෙන් හිංසනයට ලක්වීම හෝ ඉන් පසු ඔබ සේවායෝජකයාට අඛණ්ඩව සේවය කිරීම.

ගැටලු අංක 1: මගේ සේවා යෝජකයා විසින් මාව ලිංගිකව හිංසනයට ලක්කරන ලදී මම ඔහුට එය නවත්වන ලෙස දන්වා සිටි අතර සහ EOC වෙත පැමිණිලි කරන බවට සැල කර සිටියෙමි. දින කිහිපයකට පසු ඔහු මගේ සේවා කොන්තරාත්තුව අත්හිටුවන ලදී. EOC ආයතනයට මට උදව් කළ හැකිද?

විසදුම: ඔව් ඔබ SDO යටතේ පැමිණිල්ලක් ගොනුකර හෝ ගොනු කිරීමට අදහස් කර තිබෙන බැවින් ඔබට අසාධාරණ ලෙස සැලකුවහොත්, ඔබව නීතියෙන් ආරක්ෂා කරන අතර, ලිංගික හිංසනය සහ පීඩාවට ලක්වීම යටතේ ඔබට EOC වෙත පැමිණිල්ලක් යොමු කළ හැකිය. තවද ඔබ කෙනෙකු වෙනුවෙන් සාක්ෂි දීම, පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම, හෝ SDO යටතේ නීති ක්‍රියාමාර්ගයක් ගැනීම වැනි දේ කිරීම නිසා ඔබට අසාධාරණයක් වන අවස්ථා වලදි ද ඔබට ආරක්ෂාව ලැබේ.

භාණ්ඩ, පහසුකම් සහ සේවා සැපයීමේදී වන ලිංගික හිංසනයට එරෙහිවද ආරක්ෂාව ලබාදේ සේවා සපයන්නෙකුට තම පාරිභෝගිකයාට හෝ පාරිභෝගිකයට තම සේවා සපයන්නාට ලිංගිකව හිංසනයට ලක් කිරීම නීති විරෝධි වේ.





ගැටලු අංක 2: ලිංගික හිංසනය පොදු වැරැද්දක් වන අතර එය SDO ට අනුව නීත්‍යානුකූල නොවන ලෙස සලකයි. එහි ස්වභාවය සහ බරපතල කම අනුව සමහර ලිංගික හිංසනයන් එනම් පීඩාකිරීම හෝ දූෂණය කිරීම ආදිය අපරාධ ලෙස සලකයි

## III ඔබ ලිංගික හිංසනයට ලක්වුවහොත් කුමක් කරන්නේද?

- හිංසා කරන්නාට එය වහාම නතර කරන ලෙස පැවසීම.
- සේවා යෝජකයා හිංසාකරු නොවේ නම් පැමිණිල්ල සේවා යෝජකයා වෙත ඉදිරිපත් කරන්න. ඔබේ පැමිණිල්ල පිළිබඳව දැඩි ලෙස සහ සාධාරණව ක්‍රියා කරන ලෙස සේවා යෝජකයාගෙන් ඉල්ලා සිටින්න.
- සිදු වූ සියලු දේ ලියා දන්වන්න. එනම් දිනය වේලාව සහ සිද්ධිය වූ ස්ථානය ආදී තොරතුරු. එම පුද්ගලයා කියු දේ සහ කළ දේ ඇතුළු සිද්ධිය වන විට සිටි පුද්ගලයන් පිළිබඳවද සියලු තොරතුරු ඇතුලත් කරන්න.
- ඔබගේ මිතුරන්ගෙන්, රාජ්‍ය නොවන සංවිධාන, කම්කරු සමිති, තානාපති කාර්යාලය හෝ වෙනත් සංවිධානවල උදව් ලබාගන්න.
- EOC හි ලිංගික හිංසනයන්ට විරුද්ධව ලබාගත හැකි විසදුම් සහිත වෙබ් පිටුව ඇතුලත් වූ ප්‍රයෝජනවත් තොරතුරු සහ www.eoc.org.hk හි ඇති උපකාරක විස්තර සහිතව පරික්ෂා කරන්න.
- පැමිණිල්ලක් EOC වෙත හෝ දිස්ත්‍රික් උසාවියේ ඇති මහජන ක්‍රියාකරකම් ආයතනයට පමා නොවී වහාම ඉදිරිපත් කරන්න.
- යම්කිසි සිද්ධියක් සිදුවූ දින සිට මාස 12 ක් ඇතුලත ඒ පිළිබඳ පැමිණිල්ලක් ECO වෙත ඉදිරිපත් කළ හැකිය. සිද්ධිය සිදුවීමෙන් මාස 12 ක් ඇතුලත නීති ක්‍රියාමාර්ග ස්ථාපිත කළ යුතුයි.
- අවිනීත ලෙස අඩන්තේට්ටම් කිරීමක් හෝ දූෂණ කිරීමක් සිදුවුණි නම් වහාම පොලිසියේ පිහිට පතන්න.




සමහර ලිංගික හිංසනයන් එනම් අවිනීත ලෙස පහර දීම (ලිංගික ස්වරූපයෙන් වන ඒකමතික නොවන ක්‍රියාවන්/හසිරීම් උදාඃ- බලහත්කාරයෙන් ස්පර්ෂ කිරීම සිපවැළඳගැනීම සහ මුඛ ලිංගික සේවනය)වැනි ක්‍රියාවන් සාපරාධි වැරදි ලෙස සැලකේ. පීඩාවට භාජනය වූ පුද්ගලයින් තමන්ට සිදුවූ සිදුවීම පොලිසියට පැමිණිලි කිරීම හෝ වෙනත් සංවිධානයකින් උපකාර ලබාගැනීම කළ හැකිය. පැමිණිල්ල පොලිසියට මෙන්ම ඒ සමගම නීතිඥයන් වෙතද ඉදිරිපත් කළ හැකිය.

## IV. සේවායෝජකයන් සඳහා පනත යටතේ ඇති ඔබේ වගකීම් වටහා ගැනීම -

ගෘහස්ථ සේවකයින්ගේ සේවායෝජකයින්ට තම නිවස කිසිදු ලිංගික හිංසනයකින් තොර ස්ථානයක් බවට තහවුරු කල හැකි විය යුතුයි.

සේවායෝජකයන් සහ නිවසේ පදිංචි සියළු දෙනාම තම නිවසේ සේවය කරන ගෘහස්ථ සේවකයන් ට ලිංගික හිංසනයක් සිදුවුව හොත් පුද්ගලිකව වගකිව යුතුයි. ගෘහස්ථ සේවකයන් එක් කෙනෙකුට වඩා සිටින සේවාදායකයින්ට ලිංගික හිරිහැර පිළිබඳ දැනුමක් නොමැතිව හෝ එක් සේවකයකු තව සේවකයකුට ලිංගික හිරිහැර කළහොත් එවැනි ක්‍රියාවක් වැළැක්වීම සඳහා ඒ අය සාධාරණ පියවර ගෙන ඇති බවට ඔප්පු කළ යුතු අතර හෝ ඒ වෙනුවට තමන් එම වගකීම බාරගත යුතුයි.

ප්‍රශ්නය: මගේ විදේශීය ගෘහස්ථ සේවිකාවට නිවසට පැමිණි අමුත්තෙකු විසින් ලිංගික හිරිහැර කළ බවට මට දැනුම් දුන්නා. මම කුමක් කළ යුතුද?

පිළිතුර: ලිංගික හිංසනය පිළිබඳ ඔබට දැනුම් දුන්නත් එම පැමිණිල්ල පිළිබඳ ඔබ සාධාරණ ක්‍රියාවක් නොගන්නේ නම් ඔබ අවිනීත ක්‍රියාවකට ආධාර දුන්නෙකු බවට සැලකේ.

සේවකයකු ලිංගික හිංසනයන් පිළිබඳ පැමිණිල්ලක් යොමු කිරිම හෝ යොමු කිරීමට සැලසුම් කරගෙන සිටින බව දැනීමෙන් සේවාදායකයා විසින් ඔහුට/ඇයට පළිගැනීමේ චේතනාවෙන් අසාධාරණ ලෙස සැලකීම හෝ ඔහුගේ / ඇයගේ කොන්තරාත්තුව නිම කිරීම නීතිගරුක නොවේ.

සාමකාමී සේවාදායක හා සේව්‍ය සහ සබඳතාවයක් පවත්වා ගැනීම සේවකයින්ගේ යහ පැවැත්මට අත්‍යාවශ්‍ය වන බැවින් සේවාදායකයින් තම නිවෙස්වල එකිනෙකාට ගරු කරන පරිසරයක් ඇති කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස EOC උනන්දු කරවයි. සියළුම ගෘහස්ථ සාමාජිකයින් සහ සේවකයින් පවතින නීතියට අනුව තමන්ගේ අයිතීන් සහ වගකීම් පිළිබඳ දැන සිටිය යුතු අතර ලිංගික හිංසනයක් පිළිබඳ පැමිණිල්ලක් ලැබුණ විගස සාධාරණ ලෙස කටයුතු කළ යුතුයි.



## V. EOC වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.

සිද්ධිය සිදු වූ දිනයේ සිට මාස 12 ක් ඇතුලත පැමිණිල්ල ලිඛිතව EOC වෙත ඉදිරිපත් කළ යුතුයි. පැමිණිලි අන්තර්ජාලය හරහා, තැපැලෙන්, ෆැක්ස්, ඊමේල් හෝ අතේ ගෙනවිත් බාර දිය හැකිය. ඔබට භාෂාමය ගැටළුවක් ඇත්නම් ඔබගේ ඉල්ලීම මත අපට භාෂා පරිවර්තකයකු ලබා දිය හැකිය.

පැමිණිල්ල ලැබුණ පසු මූලික තක්සේරුවක් සිදුකර පරික්ෂණයට පෙර සමාදාන යාන්ත්‍රණය තුළින් ඒ අයගේ ආරවුල විසඳීමට කැමතිද කියා එම පාර්ශ්වයන්ගෙන් EOC විමසයි. එසේ නැතිනම් EOC ය පැමිණිල්ල පරික්ෂාවකට ලක්කර සාමාදානයෙන් විසඳීමට උනන්දු කරවයි. පවතින නීතියට අනුව අඛන්ඩව පරික්ෂණයක් පැවැත්වීම හෝ නොපැවැත්විමට EOC ය තීරණය කළ හැක.

අවසාන විසඳුමකට එළඹිය නොහැකිනම් පැමිණිලිකරු විද්වත් නීති උපදෙස් වැනි වෙනත් උපකාර EOC වෙතින් ඉල්ලුම් කළ හැක.

平 等 機 會 委 員 會
EQUAL OPPORTUNITIES COMMISSION

# VI. අපව සම්බන්ධ කරගන්න

**Equal Opportunities Commission** (සමාන අවස්ථා කොමිසම)
16/F, 41 Heung Yip Road
Wong Chuk Hang, Hong Kong.

**දුරකථනය:** 25118211

**කෙටි පණිවිඩ සේවාව:** 6972566616538
(ශ්‍රවණ සහ කථන දෝෂ සහිත පුද්ගලයින් සඳහා)

ඊමේල්: eoc@eoc.org.hk

වෙබ් අඩවිය: http://www.eoc.org.hk (ජංගම යෙදුම් අයිකන)

කාර්යාල වේලාව: පෙ.ව. 8:45 සිට ප.ව. 5:45 දක්වා

(භාෂා පරිවර්තකයින් සිටින ප්‍රමාණය අනුව, ඔබගේ ඉල්ලීම මත අර්ථ නිරූපන සේවාව ලබාගත හැකිය. නමුත් මෙම සේවාව සීමිතය)

# EMbRACE

## Respect, value, support racial equality

## 種族平等•由尊重開始

A Campaign by the Equal Opportunities Commission
由平等機會委員會推動

平等機會委員會
EQUAL OPPORTUNITIES COMMISSION


| | |
|---|---|
| **地址 Address** | : 香港黃竹坑香葉道 41 號 16 樓<br>16/F, 41 Heung Yip Road<br>Wong Chuk Hang, Hong Kong. |
| **電話 Tel** | : 852-2511 8211 |
| **傳真 Fax** | : 852-2511 8142 |
| **電子郵箱 Email** | : eoc@eoc.org.hk |
| **網址 Website** | : www.eoc.org.hk |
| **短訊查詢服務** | : 6972566616538 |
| **SMS service** | : 供聽障 / 有語言障礙人士使用<br>For people with hearing impairment/speech difficulties) |


市民可於平機會手機應用程式獲取平機會工作的資訊
EOC කාර්යයන් පිළිබඳ තොරතුරු පහත
EOC ජංගම යෙදුම් මගින් ඔබට ලබාගත හැකිය:

Download on the App Store — Download EOC iPhone App

ANDROID APP ON Google play — Download EOC Android App